# ජර්මානු විඥානවාදයට එරෙහිව කාල් මාක්ස් ගොඩනගන භෞතිකවාදී දර්ශනය

වත්සලා විපුලනාත්

Idealism is mind based philosophy and against the state of Materialism. "Mind is always existence" is the main theme of Idealism. In the German philosophy of Kant to Marx has this theme. Therefor they identify it as 'German Idealism'. On the other hand we can see Materialism is based on Material against the state of Idealism. According to this the main theme of Materialism is material always existence. As a Materialist Karl Marx attempt the changing of Society with new view point than the early German Idealists. Therefor the research article investigates the Materialism philosophy of Karl Marx against the German Idealist. The main objectives of this article are investigating the Materialism which is built by Marx against the Idealism and focusing how expansion the German Idealism to Materialism. Furthermore this article discuss about Idealism, German Idealism, Materialism and Marx's secession of Idealism. The descriptive analysis is used as a methodology part of this research. Due to the above significant points, the research is very important who are studying Philosophy, Marxism etc. Finally the research focus the endeavor of changing the world in Material with outmaneuvering the traditional Idealism.

## 01. හැඳින්වීම

මහද්වීපික දර්ශනය නියෝජනය කරනු ලබන ප්‍රධාන දර්ශන සම්ප්‍රදායකි ජර්මානු දර්ශනය. ජර්මානු දර්ශනය ආරම්භ කරනු ලබන්නේ එම්මානුවෙල් කාන්ට්

ය. කාන්ට්ගෙන් ඇරඹි ජර්මානු දර්ශනයෙහි කාල් මාක්ස් දක්වා වන කාලය තුළ රජයනු ලැබුවේ විඥානවාදයකි. එය කාන්ට්ගේ ලෝකෝත්තර විඥානවාදයෙහි සිට හේගල්ගේ පරම විඥානවාදය දක්වා දිවේ. ජර්මානු දර්ශනය තුළ විඥානවාදී ස්ථාවරයන්ට ප්‍රතිපක්ෂව යමින් ප්‍රථම වරට භෞතිකවාදී දර්ශනයක් ගොඩනගනු ලබන්නේ කාල් මාක්ස් නම් භෞතිකවාදී දාර්ශනිකයා විසිනි. ඒ අනුව කාල් මාක්ස් ජර්මානු විඥානවාදයෙන් වෙන් වීමේ හැරවුම සනිටුහන් කරමින් ඉදිරිපත් කරන භෞතිකවාදී දර්ශනය පිළිබඳවත් ජර්මානු විඥානවාදය භෞතිකවාදයක් කරා ගමන් කළ ආකාරය පිළිබඳවත් මෙහි දී අධ්‍යයනය කරනු ලැබේ.

### 02. පර්යේෂණ අරමුණු

මෙම පර්යේෂණය සිදු කිරීම මඟින් ප්‍රධාන වශයෙන් අරමුණු කිහිපයක් සාක්ෂාත් කරගැනීමට බලාපොරොත්තු වේ. ඒ අතර ජර්මානු විඥානවාදය පිළිබඳව අධ්‍යයනය කිරීම, භෞතිකවාදය පිළිබඳව අධ්‍යනය කිරීම, ජර්මානු විඥානවාදය භෞතිකවාදයක් දක්වා ගමන් කළ ආකාරය අධ්‍යනය කිරීම යනාදිය ප්‍රධාන වේ.

### 03. පර්යේෂණ ක්‍රමවේදය

විචාරාත්මක අධ්‍යයන ක්‍රමවේදය

### 04. පර්යේෂණ ගැටලුව

කාල් මාක්ස් ජර්මානු විඥානවාදය භෞතිකවාදයක් දක්වා පරිවර්තනය කළේ කෙසේද?

### 05. පර්යේෂණ සාකච්ඡාව හා විග්‍රහය

### 05.1. විඥානවාදය

විඥානවාදය යනු භෞතිකවාදී ස්ථාවරයන්ට ප්‍රතිපක්ෂ ස්ථාවරයක් දරන මනස මූලික කරගත්තකි. විඥානවාදයේ මූලික ම පිළිගැනීම වන්නේ මනස පරම වශයෙන් පවතී ය යන්න යි. ඒ අනුව විඥානවාදය සංකල්ප මත රඳා පවතින්නක් ලෙස හඳුනා ගත හැකි ය. "දළ වශයෙන් ගත් විට විඥානවාදය කියලා කියන්නේ සියල්ල මනසින් සම්භවය වෙනවා ය, මනස ප්‍රාථමික ය, මනස අධිපති ය, භෞතික ලෝකය මනසේ නිර්මාණයක් ය යන මේ වාදය යි." (ගම්ලත්, 1995, පිටුව. 9) විඥානවාදයට අනුව සංකල්පවලින්, මනසින් හා විඥානයෙන් පරිබාහිර ලෝකයක් නැත.

### 05.1. ජර්මානු විඥානවාදය

පශ්චාත් කාන්ටියානු ජර්මානු දර්ශනය ජර්මානු විඥානවාදය යන නමින් හඳුන්යි. ජර්මානු දර්ශනය ක්‍රමානුකූලව ආරම්භ කරන කාන්ට් විඥානවාදියෙක් වුවත් ශුද්ධ විඥානවාදියෙකු නොවේ. නමුත් කාන්ට්ගෙන් පසුව දිවෙන ජර්මානු දර්ශනය

ශුද්ධ විඥානවාදී අදහස්වලින් යුතු නිසා එය ජර්මානු විඥානවාදය යන නමින් හඳුන්වයි. ඒ අනුව පශ්චාත් කාන්ටියානු දාර්ශනිකයන් වන ෂොපන්හවර්, ෆිෂ්ටේ, ෂෙලිං හා හෙගල් යන අය ජර්මානු විඥානවාදී දාර්ශනික ගුරුකුලය නියෝජනය කරයි. මේ අනුව බලන කළ ජර්මානු විඥානවාදය යනු කාන්ට්ගෙන් පසුව කාන්ට් මත පදනම් වෙමින් ගොඩනැගෙන දාර්ශනික ගුරුකුලයකි. මේ ගුරුකුලයේ අය ප්‍රතිශේධනාත්මක ව මෙන්ම ප්‍රතිජානාත්මකව කාන්ට්ව කියවීමේ ප්‍රතිඵලයක් ලෙස ජර්මානු විඥානවාදය බිහි වී ඇත.

ජර්මානු විඥානවාදය එහි කූටප්‍රාප්තියට පත්වන්නේ ජෝර්ජ් හේගල් යටතේ ය. හේගල් කාන්ට් හා කාන්ට්ගේ විඥානවාදය පිළිබඳ මනා අධ්‍යයනයක් පැවැති කෙනෙකි. එමෙන්ම කාන්ට් විවේචනය කළ ෂොපන්හවර් වැනි අය සම්බන්ධයෙන් ද මනා අධ්‍යයනයක් හේගල්ට පැවතිණි. කාන්ට්ගේ විඥානවාදය වනාහි පරම විඥානවාදයක් නොවන අතර එය ලෝකෝත්තර විඥානවාදයක් විය. ලෝකෝත්තර විඥානවාදය තුළ ඇත්තේ ප්‍රපංච ලෝකයෙන් ඔබ්බට යා යුතු ය, යන අදහස පමණි. "එම්මානුවෙල් කාන්ට්ගේ දාර්ශනික ආරම්භය වූයේ ප්‍රපංච ලෝකය වනාහි මිනිස් අභිසංස්කරණයන් බව පිළිගැනීම යි. එනම් ලෝකය අප දකිනුයේ සංකල්ප තුළිණි ඃ අපගේම සංකල්ප තුළිණි. අපගේ සංකල්පවලට බාහිරව ලෝකය පැවතියත් අපගේ ඥානය ගොඩනැගෙනුයේ සංකල්ප මාර්ග කොට පමණි." (කලන්සූරිය, 1987, පිටු. 125 - 126) මීට අනුව කාන්ට්ගේ ලෝකෝත්තර විඥානවාදය වනාහි ප්‍රපංච ලෝකය ඉක්මවා යාම නම් විය.

නමුත් මීට වෙනස් වන හේගල්ගේ විඥානවාදය පරම නිරපේක්ෂක විඥානවාදයකි. "කාන්ට්ගෙන් ඇරඹි නූතන ජර්මන් දර්ශනයේ මුදුන්මල වන්නේ හේගල්ගේ දර්ශනය යි. මනුෂ්‍ය සභ්‍යත්වයෙහි ඇරඹි දර්ශනයෙහි තාර්කික අවසානය තමාගේ දර්ශනය වන පරම විඥානවාදය යැයි මොහු සාඩම්බරව සිතා තිබෙන බව පිළිගැනේ." (කලන්සූරිය, 1973, පිටුව. 321)

මේ අනුව බලන කළ ජර්මානු විඥානවාදයේ ආරම්භක පියවර තබන්නේ ඉම්මානුවෙල් කාන්ට් ය. ඒ ඔහුගේ ලෝකෝත්තර විඥානවාදයෙනි. පසුව පශ්චාත් කාන්ටියානුවන් වන ෂොපන්හවර්, ෆිෂ්ටේ, ෂෙලිං යන අය එය ජර්මානු විඥානවාදය තෙක් ඉදිරියට ගෙන ගියේ ය. අනතුරුව ජර්මානු විඥානවාදයේ කූටප්‍රාප්තිය සනිටුහන් කරමින් හේගල් සිය විඥානවාදය ගොඩනගන අතර එය පරම විඥානවාදයක් ලෙස හඳුනාගත හැකි ය. හේගල් පරම විඥානවාදියෙක් වෙන්නේ ඔහු පරම ආත්මය හෙවත් ප්‍රාණේන්ද්‍රිය වාස්තවික වශයෙන් පවතින්නේ යැයි පිළිගත් හෙයිනි. එනම් මිනිසාට ද්‍රව්‍යයන්ට පෙර පැවැතුණු පරම මනසක් පිළිබඳව හේගල් පිළිගන්නා බැවිනි.

### 05. 2. භෞතිකවාදය

භෞතිකවාදය යනු විඥානවාදී ස්ථාවරයන්ට ප්‍රතිපක්ෂ ස්ථාවරයක් දරන භෞතිකය මූලික කරගත්තකි. ඒ අනුව භෞතිකවාදයේ මූලිකම පිළිගැනීම වන්නේ

භෞතිකය පරම වශයෙන් පැවතිය යුතු බව යි. භෞතිකවාදය වනාහි භෞතිකය හෙවත් ද්‍රව්‍ය මත රඳා පවතින්නකි. භෞතිකවාදය ලෙස හැඳින්වෙන්නේ ලෝක ස්වභාවය ගැන සාකච්ඡා කිරීමේ දී ද්‍රව්‍යයට ප්‍රමුඛස්ථානය ලබා දෙන්නා වූ ද මනසට ද්විතික ස්ථානයක් (මනස ද්‍රව්‍ය මත රඳා පවතින බව හෝ මනස කෙසේවත් නොපවතින බව හෝ) ලබා දෙන්නා වූ ද මතවාද පද්ධතියකි. මීට අනුව ද්‍රව්‍ය ප්‍රාථමික වන අතර මනස හෙවත් විඥානය ද්විතීයික වේ.

ආචාර්ය කුමාරි ජයවර්ධන විසින් තම විද්‍යාත්මක සමාජවාදයඃ කෙටි හැඳින්වීමක් නම් කෘතියේ දී භෞතිකවාදයේ මූලික ඉගැන්වීම් පහත ආකාරයට සාරාංශ කොට දක්වා තිබේ.

01. භෞතිකවාදයෙන් උගන්වන්නේ භෞතිකය (ද්‍රව්‍ය) ප්‍රාථමික බව යි. සිත බිහිකරන්නේ භෞතිකයෙන් බව යි. දෙවියන් මවනු ලැබ ඇත්තේ මිනිසුන් විසින් බව යි. පවත්නා හැමදෙයක්ම භෞතික හේතූන් තුළින් උත්පාද වූ බව යි.

02. භෞතිකය යනු සිතට බාහිරව ස්වාධීනව පවත්නා වාස්තවික යථාර්ථයක් බව ද මානසික හෝ ආධ්‍යාත්මික හෝ හැමදෙයක් ම භෞතික ක්‍රියාවලීන්ගේ ප්‍රතිඵල බව ද භෞතිකවාදයෙන් උගන්ව යි.

03. ප්‍රකෘති ලෝකයත් ඒ තුළ බලපාන නීතිත් සොයා දැනගත හැකි බව ද අවබෝධ කොට ගත නොහැකි නැතහොත් දැනගත නොහැකි කිසිවක් නොමැති බව ද භෞතිකවාදයෙන් උගන්ව යි.

04. භෞතිකවාදය කියන අන්දමට මිනිසුන්ගේ අදහස්, හැසිරීම් හා ආකල්ප හැඩගැසෙන්නේ පරිසරයේ බලපෑම අනුව ය. පරිසරය වෙනස් වන විට අදහස්, හැසිරීම් හා ආකල්ප ද වෙනස් වෙයි. උත්පත්තියේ දී මිනිස්සු හොඳ හෝ නරක නොවෙති. මිනිසුන් දූෂිත වී ඇත්නම් ඒ සමාජය විසින් ඔවුන් ඒ මගට යොමු කරන ලද නිසා ය.” (විද්‍යාත්මක සමාජවාදය : කෙටි හැඳින්වීමක්, 1979, පිටු. 4-5)

කුමාරි ජයවර්ධනගේ සංක්ෂිප්ත කරන ලද මෙම ප්‍රකාශයන්හි භෞතිකවාදයෙහි හරය අන්තර්ගත වේ. මාක්ස් විසින් ගොඩනගන භෞතිකවාදය ද මෙකී සංකල්ප මත පදනම් ව ගොඩ නැගී ඇත. එනම් මාක්ස් සිය දර්ශනය භෞතිකවාදී පදනමකින් ගොඩ නගා ඇති අතර එහිදී ඔහු ප්‍රමුඛස්ථානය ලබාදී ඇත්තේ සමාජයේ පවතින භෞතික සාධකයන් කෙරෙහි ය.

**05. 3. ජර්මානු විඥානවාදයට එරෙහිව කාල් මාක්ස් ගොඩනගන භෞතිකවාදී දර්ශනය**

දාර්ශනිකයෙකු, දේශපාලන චින්තකයෙකු, ආර්ථික විද්‍යාඥයෙකු, සමාජ විද්‍යාඥයෙකු සහ විප්ලවවාදියකු ලෙස හඳුනාගනු ලබන කාල් මාක්ස් ප්‍රෂියාවට අයත් රයින්ලන්තය නම් ප්‍රදේශයේ 1818 දී උපත ලැබීය. කාල් මාක්ස් එතැන් පටන් අවුරුදු 65 ක සිය ජීවිත කාලය තුළ මානවයා උදෙසා උත්කෘෂ්ට සේවයක් ඉටු කළේ ය.

මොහු බොන් සහ බර්ලින් විශ්වවිද්‍යාලවලින් නීතිය සහ දර්ශනය හැදෑරී ය. එම කාලය තුළ මාක්ස්ට හේගලියානු බලපෑම ලැබී තිබේ. 1847 දී මාක්ස්ට ෆෙඩ්රික් එංගල්ස් හමුවන අතර අනතුරුව එංගල්ස් හා එක්ව මාක්ස් තම භෞතිකවාදී දර්ශනය ගොඩනැගීය. මෙලෙස මාක්ස් විසින් ඉදිරිපත් කරන ලද දර්ශනය මානවයා උදෙසාම වූ අතර එය පීඩිත හා සූරාකෑමට ලක්වන මිනිස්සුන්ට පිහිටක් විය.

ලන්ඩන්හි දැඩි ආර්ථික පීඩනයක් සහිත කාලයක ජීවත් වූ කාල් මාක්ස් පැවති ධනවාදී ආර්ථික ක්‍රමයට විවේචන එල්ල කරමින් සූරා කෑමෙන් තොර නව සමාජයක් බිහි කිරීමට උත්සාහ ගත්තේය. ඒ ඔහු විසින් රචිත ප්‍රාග්ධනය, කොමියුනිස්ට් ප්‍රකාශනය, ෆොයබාක් තීසිස, ජර්මන් දෘෂ්ටිවාදය, දර්ශනයේ දරිද්‍රතාවය යනාදී වූ කෘතීන් මඟින් ය. මාක්ස්ගේ දර්ශනය සාම්ප්‍රදායික අර්ථයෙන් ගත් කල තවත් එක් දර්ශනයක් පමණක්ම නොවේ. එය පවතින දර්ශනයට විකල්පයක් ලෙස ඉදිරිපත් කළා වූ ප්‍රතිදර්ශනයකි. එසේත් නැතිනම් න-දර්ශනයකි. බොහෝවිට නූතන යුගයේ බිහි වූ ප්‍රබලම ප්‍රතිදර්ශනය වනාහි මාක්ස්වාදී දර්ශනය වේ. ඒ අනුව ජර්මානු විඥානවාදය භෞතිකවාදයක් බවට පරිවර්තනය කිරීමේ ලක්ෂය සනිටුහන් කරන්නේ කාල් මාක්ස් ය.

කාල් මාක්ස් භෞතිකවාදියෙකු ලෙස සැලකීමේ දී ඔහු තමාට පෙර සිටි ජර්මානු විඥානවාදීන්ගෙන් වෙනස්ව නව ආකාරයකට සමාජය වෙනස් කිරීම සම්බන්ධයෙන් උනන්දු විය. එනම් සාම්ප්‍රදායික විඥානවාදයෙන් වෙනස්ව එය අභිබවා යමින් භෞතිකය තුළින් ලෝකය වෙනස් කිරීමට ඔහු උත්සාහ ගත්තේය. එහිදී මාක්ස් තම භෞතිකවාදී දර්ශනය තුළින් ඍජුවම හේගල්ගේ විඥානවාදයට ප්‍රතිචාර දක්වන අතර එම ප්‍රතිචාරය හේගල්ට පමණක් නොව කාන්ට්, ප්ලේටෝ, බුදුන් වහන්සේ වැනි සියලු විඥානවාදීන්ට එරෙහිව ලබා දුන් පිළිතුරක් විය. මාක්ස්ගේ එම ප්‍රතිචාරය ෆොයබා පිළිබඳව වන එකොළොස්වන ප්‍රවාදයෙන් පැහැදිලි වේ.

"දාර්ශනිකයින් විසින් මෙතෙක් කල් කර තිබුණේ ලෝකය විස්තර කිරීමයි. එහෙත් කළ යුත්තේ ලෝකය වෙනස් කිරීමයි." (ඊගල්ටන්, 2000, පිටුව. XIV)

මාක්ස් මෙහිදී ලෝකය ලෙස හඳුන්වන්නේ අන්කිසිවක් නොව සමාජය යි. මාක්ස්ට පෙර සිටි හේගල් ප්‍රමුඛ ජර්මානු විඥානවාදීන් සමාජය පිළිබඳව කළ අධ්‍යනයන්හි දී විඥානය මත පදනම්ව සමාජය විස්තර කිරීමට සීමා වූව ද මාක්ස් එම සීමාවන්ගෙන් ඔබ්බට යමින් භෞතිකය මත පදනම්ව සමාජය වෙනස් කිරීමේ පුළුල් ව්‍යායාමයක නිරත විය. මාක්ස්ගේ සමාජය වෙනස් කිරීමේ ප්‍රයත්නය හුදු දාර්ශනික එකක් ම වූයේ නැත. සමාජය වෙනස් කිරීමට නම් ලෝකයේ යථාර්ථය නිවැරදිව තේරුම් ගැනීම අත්‍යවශ්‍ය වන බව මාක්ස්ගේ විශ්වාසය විණි. එම යථාර්ථය තේරුම් ගැනීමට සමාජය තුළ ඇති ආගම, විද්‍යාව, අධිභෞතිකවාදී විශ්වාස යන ඒවා ඉක්මවා යමින් මතුපිටින් නොපෙනෙන්නා වූ ලෝකය ක්‍රියාත්මක වීම කෙරෙහි පදනම් වන්නා වූ නීතිය සොයාගත යුතු ය යන්න මාක්ස්ගේ යෝජනාව විය. ඒ තුළ මාක්ස් ඉදිරිපත් කරන ලද භෞතිකවාදී දර්ශනය අදියර දෙකකින් යුක්ත විණි.

- සමාජය අධ්‍යයනය කිරීම
- සමාජය වෙනස් කිරීම

"සමාජය යනු කුමක් ද යන්නට පිළිතුරු සපයනවාට වඩා මාක්ස් උත්සාහ කළේ සමාජයේ වෙනස් වීම සහ වර්ධනය සඳහා න්‍යායක් සැපයීමට ය." (මල්ලිකාරච්චි, 2003, පිටුව. 36)

කාල් මාක්ස් සමාජ විවේචකයෙකු, පන්ති රහිත සමාජයකට මඟ පෙන්වන්නා වූ න්‍යායාචාර්යවරයෙකු, සමාජ ප්‍රශ්නවලට පිළිතුරු ඉදිරිපත් කළ විවේචකයෙකු ආදි වශයෙන් ආකාර කිහිපයකින් ම තම කාර්යය ඉටු කළේය.

මාක්ස් සිය දර්ශනය තුළින් ගොඩනගන භෞතිකවාදය දෙයාකාර වේ. ඒ වනාහි ඓතිහාසික භෞතිකවාදය සහ අපෝහක භෞතිකවාදය යි.

**මාක්ස්ගේ දර්ශනය**

**ඓතිහාසික භෞතිකවාදය** | **අපෝහක භෞතිකවාදය**

මීට අනුව මාක්ස්ගේ දර්ශනය වනාහි ඓතිහාසික හා දයලෙක්තික භෞතිකවාදයේ එකතුවකි. මීට අමතරව පරාරෝපණය, පන්ති ගැටුම, අධෝ ව්‍යුහය හා උපරි ව්‍යුහය යන සංකල්ප ද මාක්ස්ගේ භෞතිකවාදයෙහි ලා යොදාගෙන තිබේ. "සමස්ත මානව ඉතිහාසය කාලානුගත කිරීම මෙන්ම සමස්ත සමාජ සම්බන්ධතාවන්ගේ ප්‍රකාරයන් එපරිදි සකස් වූයේ ඉතිහාසය තුළ ආර්ථික කරුණු කරන ලද භූමිකාව මත යැයි මාක්ස් අවධාරණය කළේය. ඓතිහාසික හා අපෝහක භෞතිකවාදී දෘෂ්ටිකෝණයන් තුළින් තමාගේ මෙම නිගමන තාර්කිකව ප්‍රතිපාදනය කිරීමට මාක්ස් උත්සාහ කළේය." (මල්ලිකාරච්චි, 2010, පිටුව. 37)

මාක්ස් පවතින සමාජ ක්‍රමය පිළිබඳ තම මතවාදය ඉදිරිපත් කරන්නේ අපෝහක භෞතිකවාදය මත න්‍යායගත වෙමිනි. මාක්ස් මෙම මතවාදය ඉදිරිපත් කිරීමට පෙර ජර්මන් ජාතික මහාචාර්ය හේගල්ගේ අනුගාමිකයෙකු විය. අපෝහක භෞතිකවාදය මුලින්ම ඉදිරිපත් කරනු ලබන්නේ හේගල් විසිනි. හේගල්ට අනුව අපෝහක භෞතිකවාදය විඥානය පදනම් කරගත් ක්‍රියාවලියකි. ඔහුට අනුව විඥනය තුළ වාදය, ප්‍රතිවාදය හා සහවාදය යනුවෙන් අවස්ථා තුනකි. එහිදී මුලින්ම ඇතිවන මතය වාදයයි. ඊට විරුද්ධව ඇතිවන මතය ප්‍රතිවාදය යි. එම මත දෙක ගැටීමෙන් සහවාදය හෙවත් නව මතවාදයක් ඇති වේ. යම් දිනෙක එය ප්‍රවාදයක් බවට පත් වේ. මෙලෙස ගමන් කරන මතවාදයේ අවසාන ඵලය රාජ්‍ය වන බව හේගල්ගේ අදහස විය.

මාක්ස් හේගල්ගේ අපෝහකවාදය පිළිගත්තත් ඊට හෙගල් දක්වා ඇති විඥානයේ ඇති බලපෑම ප්‍රතික්ෂේප කළේ ය. ඔහුට අනුව අපෝහකත්වය ක්‍රියාත්මක වන්නේ විඥානය තුළ නොව භෞතිකත්වය තුළ යි. "හේගල්ගේ විඥානවාදය ප්‍රතික්ෂේප

කළ මාක්ස් ඔළුවෙන් සිටගෙන සිටි සෑම දෙනාවම පාහේ කකුල් දෙකෙන් සිටුවීමේ අවශ්‍යතාවය හොඳින් දැන සිටියේ ය." (මල්ලිකාරච්චි, 2003, පිටුව. 36) නමුත් මාක්ස් මෙහිදී හේගල් ඉදිරිපත් කළ ද්විසටනාත්මක ක්‍රමයේ මූලික සිද්ධාන්ත තුන පිළිගත්තේය.

- "ප්‍රතිවිරුද්ධයන් එකක් අනෙක තුළ පිහිටීමේ ස්වභාවයෙන් යුක්ත ය
- ප්‍රමාණාත්මක වෙනස්වීම් ගුණාත්මක වෙනස්වීම්වලට තුඩු දෙයි
- යමක් නිශේධ වී ඇති වන්නද නිෂේධ වෙයි (සිල්වා, 1994, පිටුව. 8)

ප්‍රතිවිරෝධය යන්නෙන් මාක්ස් අදහස් කරන්නේ විශ්වයේ සෑම දෙයකට ම ප්‍රතිවිරුද්ධතාවක් පවතින බව යි. (වහල් යුගයේ වහල් හිමියාට ප්‍රතිවිරුද්ධව ගොඩනැගුනේ වහලා ය) මේ ප්‍රතිවිරෝධතාව හේතුකොට ගෙන සමාජය ඉදිරියට විකාශය වේ. (වහලුන් වහල් හිමියන්ට එරෙහිව නැගී සිටීම මත ඇති වන සට්ටනය හේතු කොටගෙන වහල් සමාජය බිඳ වැටී වැඩවසම් සමාජය නිර්මාණය වේ.) එය මුලින් ප්‍රමාණාත්මකවත් පසුව ගුණාත්මකවත් සිදුවන විකාශයකි. මෙලෙස සමාජ ක්‍රමය ඉදිරියට විකාශය වුවත් ඒ තුළ පැවති පැරණි සමාජ ක්‍රමයන්ගේ ලක්ෂණ සීයට සීයක් අභාවයට නොයන බව මාක්ස් සිය අපෝහක භෞතිකවාදයෙන් පෙන්වා දෙයි. (වහල් සමාජයෙන් පසුව නිර්මිත වැඩවසම් සමාජය තුළ වූව ද වහල් සමාජයේ ලක්ෂණ දැකගත හැකි වේ.) "ඇතිවීම වර්ධනය හා නැතිවීම යන ලක්ෂණවලින් යුත් සමාජය නිරතුරුවම වෙනස් වීමට භාජනය වෙයි. මේ ක්‍රියා සන්තතිය, හේතුඵල නියාමය නිසා එකට බැඳී ඇත." (පාලිත හිමි, 1968, පිටුව. 36) මේ ආකාරයට විඥානවාදයේ හා පැරණි ද්‍රව්‍යවාදී දර්ශනයේ මූලධර්ම එකට සංයෝග කරමින් අපෝහක භෞතිකවාදය නම් නව ප්‍රවේශය මාක්ස් විසින් ගොඩනගනු ලැබීය. මෙහිදී මාක්ස් විඥානවාදී දාර්ශනිකයෙකු වන හේගල්ගේ දර්ශනයේ ආභාසය ලැබූව ද හේගල්ගේ විඥානවාදය ප්‍රතික්ෂේප කරයි. මේ තුළ මාක්ස් අපෝහක භෞතිකවාදයට අනුව සමාජය චාලකය. එම චාලකත්වය මත පදනම් වෙමින් ඉතිහාසය භෞතිකයේ චාලක බලවේගය බවට පත් වන බව මාක්ස් දක්වා තිබේ.

සමාජය ස්ථිතික නොවන ගතික සංස්ථාවකි යන අදහස මාක්ස් ඓතිහාසික භෞතිකවාදය තුළින් සමාජගත කළේය. කාල් මාක්ස් සිය ජර්මන් දෘෂ්ටිවාදය හා කොමියුනිස්ට් ප්‍රකාශනය යන කෘති හරහා ඓතිහාසික භෞතිකවාදයේ අවශ්‍යතාව පැහැදිලි කර තිබේ. මාක්ස්ගේ ඉතිහාසය පිළිබඳව වන මෙම ඓතිහාසික භෞතිකවාදී සංකල්පකරණයට පාදක වූයේ මුලින් දක්වන ලද දයලෙක්තික භෞතිකවාදය හෙවත් අපෝහක භෞතිකවාදය යි. මාක්ස්ගේ ඓතිහාසික භෞතිකවාදයට අනුව සමාජය ඓතිහාසිකව නිර්මාණය වී ඇත්තේ චලනය නම් න්‍යායට යටත්ව ය. "සමාජ ජීවිතයේ ඇති භෞතිකවාදී ස්වභාවය විස්තර කරමින් සමාජය වෙනස් කළ හැකි හා වෙනස් කළ යුතු ආකාරය විස්තර කරන විද්‍යාව ඓතිහාසික භෞතිකවාදය ය." (අපනාසියාවේ, 2007, පිටුව. 12) එහිදී මාක්ස් ඓතිහාසිකව සිදු වූ සමාජ විකාශය ප්‍රධාන රූප කිහිපයක් මඟින් හඳුනාගනී.

- සන සමාජය
- වහල් සමාජය
- වැඩවසම් සමාජය
- ධනවාදී සමාජය හෙවත් නූතන කාර්මික සමාජය
- සමාජවාදී සමාජය
- උත්තරීතර කොමියුනිස්ට් සමාජය

මාක්ස්ට අනුව සමාජ විකාශය ආරම්භය වන්නේ සන සමාජය හෙවත් ප්‍රාග් කොමියුනිස්ට් සමාජ ක්‍රමය තුළිනි. සන සමාජය තුළ පොදු දේපල ක්‍රමයක් පැවැති අතර සියලු සමාජ අයිතීන් සමස්ත සමාජයටම හිමි විණි. එනිසා සන සමාජය තුළ සමාජය පංති වී නොතිබිණි. එනමුත් සන සමාජයෙන් පසුව එළඹෙන වහල් සමාජ ක්‍රමය තුළ ප්‍රථම වතාවට පෞද්ගලික දේපළ ක්‍රමයක් නිර්මාණය විණි. එම සමාජ ක්‍රමයේදී නිෂ්පාදන ප්‍රකාරය ශ්‍රමය වූ අතර ශ්‍රමය මත පදනම් වෙමින් වහලුන් හා වහල් හිමියන් ලෙස සමාජය තුළ පන්ති ද්විත්වයක් නිර්මාණය විණි. කලකට පසු වහලුන් වහල් හිමියන්ට එරෙහිව නැගී සිටි අතර ඒ මත පන්ති ප්‍රතිවිරෝධතාවයක් නිර්මාණය විණි. එය සට්ටනය එසේත් නැතිනම් ගැටුම ලෙස හඳුන්වනු ලබයි. මෙම සට්ටනය මත පදනම් වෙමින් වහල් සමාජය බිඳ වැටී වැඩවසම් සමාජ ක්‍රමය නිර්මාණය විණි. වැඩවසම් සමාජය තුළ නිෂ්පාදන ප්‍රකාරය ඉඩම වූ අතර ඉඩම් හිමි රදළ පන්තියක් සහ එහි සේවය කරන ප්‍රවේණි දාසයන් යනුවෙන් සමාජය පංති විණි. ප්‍රවේණි දාසයන් ද රදළයන්ට එරෙහිව නැගී සිටි අතර එම ගැටුම මත පදනම් වෙමින් වැඩවසම් සමාජ ක්‍රමය බිඳ වැටී නූතන කාර්මික සමාජය නිර්මාණය විණි.


නූතන කාර්මික සමාජය මුදල් කේන්ද්‍ර කරගත් සමාජයක් වන බැවින් ධනවාදී සමාජය ලෙස ද හඳුන්වනු ලබයි. මේ යුගයේ ප්‍රධාන පන්ති දෙක බවට පත් වන්නේ ධනපති පංතිය සහ නිර්ධන පංතිය යි. මාක්ස්ට අනුව අප දැන් ජීවත් වන්නේ නූතන කාර්මික සමාජය තුළය. "මාක්ස් ධනපති සමාජ ආර්ථික ක්‍රමය යහපත් ය. තර්කාන්විත ය සහ සදාකල් පවතී ය යන අදහස් විධිමත්ව අභියෝගයට ලක් කළ ප්‍රථම චින්තකයා වේ." (සමරනායක, 2003, පිටුව. 253) මාක්ස්ට අනුව මෙම ධනවාදී සමාජය තුළ ධනපති සහ නිර්ධන පන්ති ද්විත්වය අතර යම් දිනෙක ප්‍රතිවිරෝධයක් ඇතිවන අතර එම විප්ලවයෙන් පසුව සමාජවාදී සමාජය නමින් නව සමාජ ක්‍රමයක් නිර්මාණය වේ. එම සමාජ ක්‍රමය තුළ ඉතිහාසයේ ප්‍රථම වතාවට නිර්ධන පන්තිය හෙවත් පීඩිත පන්තිය දේශපාලන ආධිපත්‍ය ලබා ගන්නා අතර ඔවුන් ක්‍රමිකව සමාජය තුළ පුද්ගලික දේපළ ක්‍රමය අහෝසි කරනු ඇත.

කෙසේ නමුත් ධනපති පංතිය තමාට අහිමිවන බලය, දේපල උදෙසා ප්‍රතිවිප්ලවීය ක්‍රියාමාර්ගයකට අවතීර්ණය වීමේ අවධානමක් තවදුරටත් පවතින බැවින් සමාජවාදී සමාජය තුළ වුව ද රාජ්‍යක් පවතින බව මාක්ස් පවසයි. එනම් නැවත අරගලයක් ඇති වුවහොත් එය මර්ධනය කිරීමට පන්ති පීඩක උපකරණයක් වන රාජ්‍යයේ අවශ්‍යතාව

තවදුරටත් පවතින බව මාක්ස් පෙන්වා දුන්නේය. නමුත් මෙම සමාජ ක්‍රමය ක්‍රමිකව විකාශය වීම තුළින් සමාජයේ සමස්ත දේපළ පොදු දේපල බවට පත්වන අතර එවැනි තත්වයක් තුළ පංති ක්‍රමය අහෝසි වී රාජ්‍යයේ අවශ්‍යතාවය ද වියැකී යන බව මාක්ස් පැවසී ය. මේ අනුව කපු කටින යන්ත්‍රය හා තඹ පොරොව මෙන් රාජ්‍ය ද ඉතිහාසයේ කටුගෙට යන බව මාක්ස් පෙන්වා දුන්නේය. මෙලෙස රාජ්‍ය අහෝසි වී යාම තුළ නිර්මාණය වන නව සමාජ ක්‍රමය උත්තරීතර කොමියුනිස්ට් සමාජය නම්වන බව මාක්ස්ගේ මතය විය. කෙසේ වෙතත් අදවනතුරුත් මාක්ස්ගේ එම සමාජ ක්‍රමය දැක ගැනීමට නොහැකි ය. එනමුත් මාක්ස් මේ ආකාරයට ඉතිහාසය විග්‍රහ කිරීම මෙතෙක් දාර්ශනිකයින් ඉතිහාසය විග්‍රහ කළ ආකාරයට හාත්පසින්ම වෙනස් තත්වයකි.

කෙසේ නමුත් මින් පැහැදිලි වන ආකාරයට සමාජය ඉදිරියට විකාශය වීමේ ගාමක බලවේගය බවට පත්ව ඇත්තේ ගැටුම හෙවත් සට්ටනයයි. ඒ අනුව මාක්ස් පෙන්වා දෙන්නේ සමාජය අධ්‍යයනය කිරීමට ඇති එකම ක්‍රමවේදය සට්ටනය වන බවයි. ඒ මත පදනම්ව මාක්ස් නව සමාජ න්‍යායක් ගොඩනගන අතර එය 'සට්ටන න්‍යාය' නම් වේ. මේ ආකාරයට මාක්ස් විඥානවාදීන්ට වෙනස්ව යමින් භෞතික සාධක හරහා සමාජය අධ්‍යනය කිරීම උදෙසා නවතම න්‍යායක් හඳුන්වා දුන්නේය.

මෙලෙසට සාම්ප්‍රදායික සමාජ න්‍යායන් හා අධ්‍යයනයන්ගෙන් වෙනස්ව යමින් කාල් මාක්ස් විසින් දේශපාලන අරමුණුවලින් තොරව භෞතිකව සමාජය අධ්‍යයනය කිරීමේ වැදගත්කම අවධාරණය කළේය. එහිදී මාක්ස් ආර්ථික සාධකය මඟින් සමාජය විග්‍රහ කිරීමට උත්සාහ කළේය. ඒ අනුව මාක්ස් ආර්ථිකය තුළින් සමාජය විග්‍රහ කළ ප්‍රථමයා ලෙසට ඉතිහාසගත විණි. එනම් මිනිස් ජීවිතයේ මෙන්ම සමාජ ජීවිතයෙහි පවතින ගතිලක්ෂණ ආර්ථික කරුණු විසින් තීරණය කරන බව මාක්ස් දැක්විය. මෙයද මාක්ස්ගේ ප්‍රධාන භෞතිකවාදී විග්‍රහයකි. මොහු සමාජ ව්‍යුහය උපරි ව්‍යුහය හා අධෝ ව්‍යුහය යනුවෙන් ප්‍රධාන කොටස් දෙකකට බෙදෙන ලදි. ඒ අනුව ඕනෑම සමාජයක පදනම හෙවත් අධෝ ව්‍යුහය ආර්ථිකය වන බව මාක්ස් අනාවරණය කළේය. "සමාජයේ පවතින විවිධ අදහස් සමාජය කෙරෙහි වැදගත් වශයෙන් බලපාන බව මාක්ස්ට කලින් සිටි චින්තකයින්ගේ අදහස විය. නමුත් මාක්ස් කියා සිටියේ සමාජයේ අදහස් ඇති වන්නේ එම සමාජයේ තුළ තිබෙන ආර්ථික රටාව නිසා වන බවයි." (ධර්මසිරි, 2000, පිටුව. 177)



ආර්ථිකය හැර සමාජය තුළ පවතින අනෙක් සියලුම දේ එනම් ආගම, නීතිය, මාධ්‍ය, දේශපාලනය වැනි දේ උපරි ව්‍යූහයට අයත්වන බව ඔහු දක්වයි. ඒ අනුව මාක්ස් සමාජය වනාහී ආර්ථිකය මත පදනම්වන සබඳතා ජාලාවක් වන බවට නිර්වචනය කළේය.

මාක්ස්ගේ භෞතිකවාදී දර්ශනයෙහි ලා පරාරෝපණ සංකල්පය ද වැදගත් වේ. එනම් මාක්ස්ගේ සමාජ න්‍යාය පරාරෝපණ න්‍යායක් වශයෙන් ද වැදගත් ය. මාක්ස්ට අනුව පරාරෝපණය දෙයාකාරය.

- ආර්ථික පරාරෝපණය
- ආගමික පරාරෝපණය

මාක්ස් ප්‍රකාශ කරන ආකාරයට පරාරෝපණය යනු තමාගේ දේ ක්‍රමයෙන් තමාගෙන් ඈත් වී කිසියම් ශක්තියක් ලෙස වර්ධනය වෙමින් තමන්ව පීඩාවට පත් කිරීම යි. මාක්ස් මෙම සංකල්පය යොදා ගන්නේ ධනවාදී සමාජ ක්‍රමයක කම්කරුවන් තම ජීවිතයෙන් ක්‍රමිකව වෙන් කිරීමේ ක්‍රියාවලිය අර්ථ දැක්වීමට යි. මාක්ස්ට අනුව ආර්ථික පරාරෝපණය කිහිප ආකාරයටම සිදු වේ. ඒ තුළ කම්කරුවන් ආකාර කීපයකින්ම පරාරෝපණය වේ. එනම් නිෂ්පාදන මාර්ගවලට ඇති අයිතියෙන්, තම ශ්‍රමයේ ඵලයෙන්, ශ්‍රමයෙන් සහ කළමනාකරණයට සහභාගි වීමෙන් යන සෑම ආකාරයකින් ම ධනවාදී සමාජයක් තුළ කම්කරුවා පරාරෝපණය වේ. අවසානයේදී ධනවාදී සමාජයක් තුළ කම්කරුවා තම ජීවිතයෙන් පවා පරාරෝපණය වන බව මාක්ස් පෙන්වා දී තිබේ.

මාක්ස්ගේ භෞතිකවාදී අදහස්හි ලා ආගමික පරාරෝපණය පිළිබඳව ඇති අදහස් ද වැදගත් වේ. මාක්ස් ආගම සම්බන්ධයෙන් ඉදිරිපත් කරනු ලබන්නේ භෞතිකවාදී විශ්ලේෂණයකි. මොහුට අනුව ආගම තුළින් සිදු කරන්නේ මිනිසුන් අන්ධයන් බවට පත් කිරීමකි. මාක්ස්ට අනුව ආගම යනු පන්ති පීඩක උපකරණයකි. එනම් ඇති පංතිය විසින් නැති පංතිය මර්ධනය කිරීම උදෙසා නිර්මාණය කළ උපකරණයකි. "ආගම වූ කලී පීඩිත අසරණයාගේ සුසුම ය. හිතක් පපුවක් නැති කුරිරු ලෝකයේ කරුණාබර හදවත ය. හැඟීමෙන් තොර අචේතනික තත්වයක සජීවී ආත්මය ය. ජනතාවගේ අබිං ය." (ජයවර්ධන, 1995, පිටුව. 81) මිනිසුන් දෙවියන්ගේ නිර්මාණයක් නොවන බවත් දෙවියන් මිනිසුන්ගේ නිර්මාණයක් වන බවත් මාක්ස් විසින් සඳහන් කරන්නේ එබැවිනි. එනම් ආගම සම්බන්ධයෙන් මාක්ස් ඉදිරිපත් කරන්නේ විවේචනයකි. ඒ තුළ තමන් විසින් නිර්මාණය කරන ලද දෙවියන් තමන්ගෙන් පරාරෝපණය වී ඔහු තමන්ව නිර්මාණය කළ බව පවසන බවට දක්වන මාක්ස් ඒ තුළ දැඩි ලෙස ආගම විවේචනය කොට තිබේ. ඒ විඥානවාදීන්ගෙන් වෙනස්ව යමින් ප්‍රථම වතාවට ආගමික විවේචනයක් හරහා ආගම මිනිසුන්ගේ නිර්මාණයක් ලෙස සළකා භෞතිකවාදී දෘෂ්ටියකින් ආගම අධ්‍යනය කළ කෙනෙක් ලෙසට ය.

මේ ආකාරයට මාක්ස් එවකට පැවතියා වූ ජර්මානු විඥානවාදයෙන් වෙනස්ව යමින් පැවතියා වූ ධනපති සමාජ ක්‍රමයේ වූ අර්බුද පිළිබඳව ගැඹුරු විග්‍රහයක්

සිදුකළේය. එහිදී වඩාත් වැදගත් වන්නේ ලෝකය විග්‍රහ කිරීම නොව ලෝකය වෙනස් කිරීම ය යන ආස්ථානයේ පිහිටා මාක්ස් කටයතු කොට තිබේ. ඒ කාල් මාක්ස් ඉතිහාසයේ ප්‍රථම වතාවට ආර්ථිකය තුළින් සමාජය පිළිබඳව සුවිශේෂී හා නව්‍යමය වූ අධ්‍යනයක් සිදුකළ බැවිනි. මෙලෙස ආර්ථිකය පදනම කරගනිමින් මාක්ස් ගොඩනගන භෞතිකවාදී දර්ශනය ජර්මානු දර්ශනය තුළ විඥානවාදයෙන් වෙන් වීමේ ලක්ෂය සනිටුහන් කරනු ලැබී ය.

## 06. නිගමනය

විඥානවාදය යනු සංකල්ප මත රඳා පවතින්නක් ය. එනම් විඥානවාදයට අනුව සංකල්පවලින්, මනසින් හා විඥානයෙන් පරිබාහිරව ලෝකයක් නැත. විඥානවාදයට හා ජර්මානු දර්ශනයට ඇත්තේ ඉතාමත් සමීප සබඳතාවකි. ඊට හේතුව වන්නේ ජර්මානු දර්ශනයේ ආරම්භයේ පටන්ම හේගල් දක්වා පවතින්නේ විඥානවාදී දර්ශයක් වීම යි. ජර්මානු දර්ශනය ක්‍රමානුකූලව ආරම්භ කරන කාන්ට් විඥානවාදියෙක් වුවත් ශුද්ධ විඥානවාදියෙකු නොවේ. නමුත් කාන්ට්ගෙන් පසුව දිවෙන ජර්මානු දර්ශනය ශුද්ධ විඥානවාදී අදහස්වලින් යුතු නිසා එය ජර්මානු විඥානවාදය යන නමින් හඳුන්ව යි.

භෞතිකවාදය යනු විඥානවාදී ස්ථාවරයන්ට ප්‍රතිපක්ෂ ස්ථාවරයක් දරන භෞතිකය මූලික කරගත්තකි. භෞතිකවාදය ලෙස හැඳින්වෙන්නේ ලෝක ස්වභාවය ගැන සාකච්ඡා කිරීමේ දී ද්‍රව්‍යයට ප්‍රමුඛස්ථානය ලබා දෙන්නා වූ ද මනසට ද්වීතික ස්ථානයක් ලබා දෙන්නා වූ ද මතවාද පද්ධතියකි. මෙලෙස හඳුනාගනු ලබන භෞතිකවාදය ප්‍රථම වතාවට ජර්මානු දර්ශනය තුළට ගෙනඑනු ලබන්නේ කාල් මාක්ස් ය.

කාල් මාක්ස් භෞතිකවාදියෙකු ලෙස සැලකීමේ දී ඔහු තමාට පෙර සිටි ජර්මානු විඥානවාදීන්ගෙන් වෙනස්ව නව ආකාරයකට සමාජය වෙනස් කිරීම සම්බන්ධයෙන් උනන්දු විය. එනම් සාම්ප්‍රදායික විඥානවාදයෙන් වෙනස්ව එය අභිබවා යමින් භෞතිකය තුළින් ලෝකය වෙනස් කිරීමට ඔහු උත්සාහ ගත්තේය. එහිදී මාක්ස් තම භෞතිකවාදී දර්ශනය තුළින් ඍජුවම හේගල්ගේ විඥානවාදයට ප්‍රතිචාර දක්වන අතර එම ප්‍රතිචාරය හේගල්ට පමණක් නොව කාන්ට්, ප්ලේටෝ, බුදුන් වහන්සේ වැනි සියලු විඥානවාදීන්ට එරෙහිව ලබා දුන් පිළිතුරක් විය. මේ අනුව අවසාන වශයෙන් නිගමනය කළ හැක්කේ කාල් මාක්ස් ජර්මානු විඥානවාදය භෞතිකවාදයක් කරා ගෙන යාමෙහි ලා විශාල දාර්ශනික මැදිහත් වීමක් කර ඇති බව යි.

## මූලාශ්‍රය

01. අපනාසියාවේ, වී. ජී. (2007) *දයලෙක්තික භෞතිකවාදය*. කොළඹ: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

02. ඊගල්ටන්, ටෙරී. (පරි: ඩෙස්මන්ඩ් මල්ලිකාරච්චි). (2000) *කාල් මාක්ස්*. කඩවත: කඩුල්ල ප්‍රකාශකයෝ.

03. කලන්සූරිය, ඒ. ඩී. පී. (1973) *නූතන බටහිර දර්ශනය*. කොළඹ: අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තුමේන්තුව.

04. කලන්සූරිය, ඒ. ඩී. පී. (1987) *බර්ට්‍රන්ඩ් රසල් සහ සමකාලීන දර්ශනය*, වරකාපොළ: ආරිය ප්‍රකාශකයෝ.

05. ගම්ලත්, සුචරිත. (1995) *ඓතිහාසික භෞතිකවාදය සහ කලාව*, කොළඹ: එස් ගොඩගේ සහ සහෝදරයෝ.

06. ජයවර්ධන, කුමාරි (1979) *විද්‍යාත්මක සමාජවාදය: කෙටි හැඳින්වීමක්,* රාජගිරිය: දියැස ප්‍රකාශන.

07. පාලිත හිමි, හොරතැපැල. (1968) *ජාතියේ නවෝදය*, පිලිප් ගුණවර්ධන සම්මාන සංග්‍රහය, ලංකා සමාජවාදී සංගමයේ ප්‍රකාශනයකි.

08. මල්ලිකාරච්චි, ඩෙස්මන්ඩ්, *මාක්ස්වාදී රචනා*, කර්තෘ ප්‍රකාශන, 2003

09. මල්ලිකාරච්චි ඩෙස්මන්ඩ්. (2010) *කාල් පොපර් මාක්ස්වාදයේ ව්‍යාජ විවේචකයෙක්*, නුගේගොඩ: සංහිඳ මුද්‍රණ සහ ප්‍රකාශන.

10. සමරනායක, ගාමිණී. *දේශපාලන සහ සමාජ චින්තනය*, (2003) කර්තෘ ප්‍රකාශන.

11. සිල්වා, නලින්ද. (1994) *අපෝහකයේ රූපිකය*, මහරගම: චින්තන පර්ෂද ප්‍රකාශන.